# සර්ප දෂ්ටන වළකමු.



ජාතික විෂ තොරතුරු මධ්‍යස්ථානය
ශ්‍රී ලංකා ජාතික රෝහල
කොළඹ

# ගොඩබිම වසන විෂ සහිත සර්පයින්

ශ්‍රී ලංකාවේ ගොඩබිම වෙසෙන සර්ප විශේෂ 96 ක් පමණ ඇත.

මෙයින් සර්ප විශේෂ 50 ක් ශ්‍රී ලංකාවට ආවේණික වන අතර, ගොඩබිම වෙසෙන සර්පයින්ගෙන් විශේෂ 6 ක් පමණක් විෂ සහිත වේ.

## නාගයා - Common cobra (*Naja naja*)

- වලාකාර හිසක් ඇති අතර පැහැදිලි ගෙලක් නොමැත. ගෙල ප්‍රදේශයේ පෙණය සහ “ප” සළකුණ දැකිය හැකිය.
- සිරුර කළු හෝ දුඹුරු පැහැති වන අතර සුදු පටි සහිත විශේෂද වේ.



# තිත් පොළඟා- Russell's viper
# *(Daboia russelli russelli )*



- හිස ත්‍රිකෝණාකාර වන අතර පැහැදිලි ගෙලක් ඇත. හිස මත " V " සළකුණක් ඇත.
- සිරුර පුරා දික් අතට විසිරී යන පුල්ලි පේළි තුනකි. පුල්ලි තද දුඹුරු පැහැති වන අතර කළු දාරයකින් වට වී ඇත.
- දෙපස පිහිටි පුල්ලි අතර "සිග් සැග් " ආකාරයට රටාවක් දැකිය හැකිය.

# වැලි පොළඟා - Saw-scaled viper

## *(Echis carinatus)*



- හිස ත්‍රිකෝණාකාර වන අතර පැහැදිලි ගෙලක් ඇත.
- සුදු පැහැති දැඟර ඉරක් සිරුර දෙපසින් දිව යයි.
- හිස මත දුඹුරු මිශ්‍ර සුදු පැහැ කුරුළු පාදයක් වැනි ලකුණක් ඇත.

# මුදු කරවලා - Sri Lankan krait

*(Bungarus ceylonicus)*



- සිරුරේ උඩ පැත්ත තද දුඹුරු හෝ දීප්තිමත් කළු පැහැතිය.
- පැහැදිලි ගෙලක් නැත.
- වළිගයේ කෙළවර තෙක් සුදු පැහැති තනි හරස් පටි දැකිය හැක.
- සිරුරේ උඩ පැත්තේ කොඳු නාරටිය දිගේ තරමක් විශාල ෂඩාශ්‍රාකාර කොරල පේළියක් ඇත.

# තෙල් කරවලා Common krait
## (*Bungarus caeruleus* )



- සිරුරේ උඩු පැත්ත දීප්තිමත්, කළු පැහැ වන අතර යටි පැත්ත සුදු පැහැ වේ.
- පැහැදිලි ගෙලක් නැත.
- සිරුරේ උඩ පැත්තේ කොදු නාරටිය දිගේ ෂඩස්‍රාකාර කොරළ පේළියක් ඇත.
- වළිගයේ කෙලවර තෙක් සුදු පැහැති සිහින් හරස් පටි යුගල් 20-25 ක් පමණ දැකිය හැකිය. වයස් ගත වන විට මෙම සුදු පටි ක්‍රමයෙන් මැකී යයි.

# කුණකටුවා **Humpnosed viper** (*Hypnale sp.*)



- හිස ත්‍රිකෝණාකාර වන අතර පැහැදිලි ගෙලක් ඇත. බොහෝ විට හිසේ ඉදිරිපස නෙරීමක් සහිත වේ.
- හිස පොළොවෙන් අංශක 45 ක කෝණයක් සෑදෙන සේ ඔසවාගෙන සිටියි.
- නාසය හා මුඛය අතර සිදුරක් ඇත.
- වලිගය සිහින් වීමට ආරම්භ වන ස්ථානයේ කුඩා ගැටයක් ඇත.

## ශ්‍රී ලංකාවේ වෙසෙන මඳ විෂ සහිත සර්පයින්

නාග මාපිලා *Boiga forsteni*

නිදි මාපිලා *Boiga ceylonesis*

පළා පොළඟා *Trimeresurus trigonocephalus*

ඇහැටුල්ලා *Ahaetulloa nasutus*

ණිහලුවා *Balanophis ceylonesis*

දඟර දන්ඩා *Chrysopelea taprobanica*

රෑන් මාපිලා Boiga *trigonatus trigonatus*

මල් සරා *Chrysopelea ornata sinhaleya*

# ශ්‍රී ලංකාවේ වෙසෙන විෂ රහිත සර්පයින්

පුල්ලි දත් කැටියා *Oligodon sublineatus*
අහර කුක්කා *Amphiesma stolata*
කොට/වැලි පිඹුරා *Enx conica brevis*
කට කළුවා *Elaphe helena Helena*
කුරුන් කරවලා *Haplocerecus ceylonesis*
දිය වර්ණ *Atretium schistosum*
දෙපත් නයා *Chlindrophis maculata*
පිඹුරා *Python molurus molurus*
ගැට රදනකයා *Dryocalamus nympha*
කබර රදනකයා *Lycodon striatus sinhaleyus*
ගැරඬියා Coluber *nucosus maximus*
දෙපත් තුඩුල්ලා *Rhinophis trevelyana*
වයිරි දත් කැටියා *Oligodon taeniolatus ceylonicus*
මහ බිම් උල්ලා *Pseudotyphlops philippinus*
දිය බරියා/ දිය නයා *Xenochrophis piscotor discator*
රත් දණ්ඩා / ලේ මැඩිල්ලා *Aspidura brachyorrhos*
පලා බරියා *Macrophisthodon*
අරනි දත් කැටියා *Oligodon arnesis*
දිය පොළඟා *Xenochrophis asperrimus*
රෙදි නයා/ දිය ගොයා *Acrochordus granulatus*
දුමුටු කණ උල්ලා *Ramphotyphlops braminus*
අළු රදනකයා *Lycodon aulicus*
ධුමන්ඩිහයිගේ වල්ගා ඇබයා *Rhinophis dnanmondhavi wall*
තර හාල් දණ්ඩා *Dendrelathis tristis*

# විෂ ශරීරගත වීම නිසා ඇතිවන ලක්ෂණ

- **පොදු ලක්ෂණ**

  උදරයේ වේදනාව

  වමනය

- **විශේෂිත වූ ලක්ෂණ**

**නාගයා -** සපා කෑ ස්ථානය ඉදිමීම, පටක මිය යාම,සමහර අවස්ථාවලදී යම් තරමකට රුධිර කැටි ගැසීම හා සම්බන්ධ ආබාධ ඇති වේ. ස්නායු පද්ධතිය ආශ්‍රිත සංකූලතා,

**තිත් පොළඟා** - සපා කෑ ස්ථානය ඉදිමීම, රුධිරය කැටි නොගැසීම නිසා අධික රුධිර වහනය සිදු වේ. ස්නායු පද්ධතිය ආශ්‍රිත සංකූලතා.

**වැලි පොළඟා** -සපා කෑ ස්ථානය ඉදිමීම, රුධිරය කැටි නොගැසීම, ස්නායු සංකූලතා දැකිය නොහැක.

**මුදු කරවලා** ස්නායු පද්ධතිය ආශ්‍රිත සංකූලතා ඇති වේ, රුධිර කැටි ගැසීම හා සම්බන්ධ ආබාධ ඇති නොවේ.
සපා කෑ ස්ථානය අවට පටක මිය යෑමක් ද සිදු නොවේ.

**තෙල් කරවලා**

**කුණකටුවා** - දෂ්ඨ කළ ස්ථානය අවට ඉදිමීම,පටක මිය යාම බොහෝ විට දැකිය හැක. රුධිර කැටි ගැසීම හා සම්බන්ධ ආබාධ, වකුගඩු අකර්මණ්‍යතාවය හා ස්නායු පද්ධතිය ආශ්‍රිත සංකූලතා ඇති විය හැක.

# ප්‍රථමාධාර



- රෝගියා තුළ ඇති වන බිය තුරන් කරන්න



- සපාකනු ලැබූ ස්ථානය (උදා. අත/කකුල) නොසෙල්වා තබන්න



- දෂ්ට කළ ස්ථානය සබන් යොදා ගලායන ජලයෙන් හොඳින් සෝදන්න.

- තුවාලය සිදුව ඇත්තේ අතක / කකුලක නම් ඉදිමීමක් සිදුවුවහොත් තද වීමකට ලක් වීම වැළැක්වීමට පැළඳ සිටන මුදු/වළලු, නූල් සහ හිර ඇඳුම් යනාදිය ඉක්මනින් ඉවත් කළ යුතුය.



- වේදනාව සමනය කිරීමට පැරසිටමෝල් නියමිත මාත්‍රාව දෙන්න

- රෝගියා අප්‍රමාදව ආරෝග්‍යශාලාවක් කරා රැගෙන යන්න.(හැකි නම් සපා කෑ සර්පයා රෝගියා සමග ආරක්ෂාකාරීව රෝහලට ගෙන යන්න,)



# සර්ප දෂ්ටනයෙන් වැළකීමට .......

- රාත්‍රී කාලයේ ආරක්ෂිත පාවහන් නොමැතිව ගමන් බිමන් යාමෙන් වැළකීම.
- රාත්‍රී කාලයේ ගමන් යාමේදීවිදුලි පන්දමක් / ආලෝකයක් රැගෙන යාම.
- ගේදෙර / වතුපිටිවල ගෙම්බන්, මීයන් වැනි සතුන් ගැවසිය හැකි ස්ථාන විනාශ කිරීම හා එමගින් සර්පයින් ඔවුන් වෙත ආකර්ශනය වීම වැළැක්වීම.
- නිවස හා ගෙවත්ත කැලි කසලවලින් තොරව, පිරිසිදුව තබාගැනීම මගින් සර්පයින් බෝවන ස්ථාන වැළැක්වීම.







# සර්ප දෂ්ටනයෙන් වැළකීමට .......

- අදුරු සහිත ස්ථාන පිරිසිදු කිරීම, ඇඳන් යට හා මෙට්ට නිරතුරුවම පිරිසිදුකර පරීක්ෂා කිරීම.
- ගෘහභාණ්ඩ යට නිරතුරුව පිරිසිදුව තබාගැනීම හා භාවිතා කරනු ලබන ඇදුම් අනවශ්‍ය ස්ථානවල ගොඩගසා අපිළිවෙළට තැබීමෙන් වැළකීම.
- කැලෑබද හා පදුරු සහිත ප්‍රදේශවල ඇවිදීමේදී කකුල්වලින් ශබ්ද කිරීම හෝ ලී දඬු කැබැල්ලක් භාවිතයෙන් තට්ටු කිරීමෙන්, සර්පයින් ඉදිරියට පැමිණීම වැළකීම.



# සර්ප  දෂ්ටනයේදී ඔබ විසින් නොකළ යුතු දේ

- දෂ්ට කළ ස්ථානය කැපීම හෝ මුඛය තබා ඉරීම නොකළ යුතුයි.
- තිරිංග බැඳීම නොකළ යුතුය.
- කොන්ඩිස් ස්ඵටික (පොටෑසියම් පර්මැන්ගනේට්) තුවාලය සිදු වූ ස්ථානයේ නොතැබිය යුතුයි  එමඟින් පටක තවදුරටත් විනාශ වීම සිදුවේ.
- නාසය තුළින් තෙල් වැනි දේ ඇතුල් කරනු ලබන නස්න වැනි ප්‍රතිකාර ක්‍රම භයානක විය හැකිය. එවැනි ක්‍රියාවන් වෙතින් වැළකෙන්න. පෙනහලු ආසාදන හා කන් බිහිරිවීම නස්න ප්‍රතිකාර මඟින් ඇතිවිය හැකිය.







## සර්ප දෂ්ටනයේදී ඔබ විසින් නොකළ යුතු දේ

- මධ්‍යසාර, සර්ප විෂ ශරීරගත වීම ඉක්මන් කරන බැවින් පානය සඳහා නොදිය යුතුයි.
- පොටෑසියම් ලවණය බහුල වශයෙන් ඇති තැඹිලි, කුරුම්බා හා පළතුරු යුෂ වැනි දෑ නොදිය යුතුයි.
- ඇස්ප්‍රින් සහ ඇස්ප්‍රින් අඩංගු ඖෂධ භාවිතා නොකළ යුතුයි.

**Tel:** **011-2686143 / 011-2691111 Ext. 2430**

**Email : npdic.nhs@gmail.com**

**infotoxlanka@gmail.com**

**https://www.facebook.com/ NTPICSL**

**https:// twitter .com / PoisonCenterSL**

**Web site http://www.toxbaselanka.info**